# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරු වේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර, වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

## 1. අධ්‍යක්ෂ (ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය) – (පුරප්පාඩු 01)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍යවේදය (Medicine)/ ඖෂධ වෛද්‍යවේදය (Pharmacology)/ රසායන විද්‍යාව (Chemistry) /ක්ෂුද්‍රජීව විද්‍යාව (Microbiology) / අනුක ජීව විද්‍යාව (Molecular Biology) /ජීව විද්‍යාව (Biology)/ ජෛව රසායන විද්‍යාව (Bio Chemistry)/ ඖෂධවේදය (BSc Pharmacy) / භෞතික විද්‍යාව (Physics) පිළිබඳ හෝ ඖෂධවේදී (B Pharm) උපාධියක් ලබා තිබීම

   සමඟ

   ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වයස :**

අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව HM 1-1 රු: (140,640 – 15X4,100 – 202,140) වැටුප් පරිමාණයේ 2025.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 105,399/– හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

## 2. අධ්‍යක්ෂ (මූල්‍ය) – (පුරප්පාඩු 01)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය / වාණිජ්‍යය /මූල්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලන පිළිබඳ උපාධියක් ලබා තිබීම

   සමඟ

   ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් **(Masters)** ලබා තිබීම/ ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව HM 1-1 රු: (140,640 – 15X4,100 – 202,140) වැටුප් පරිමාණයේ 2025.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 105,399/– හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

## 3. අභ්‍යන්තර විගණක – (පුරප්පාඩු 01)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ වාණිජ්‍යය/ මූල්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලන (මූල්‍ය) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් විගණන ක්ෂේත්‍රයේ වසර එක (01) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් විගණන ක්ෂේත්‍රයේ වසර එක (01) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව MM 1-1 රු: (91,690 – 10 X 2,480 – 15X3,450 – 168,240) වැටුප් පරිමාණයේ 2025.01.01 දිනට නියමිත වැටුප් පියවර වන රු. 71,730/– හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

විවෘත තරඟ විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

**වෙනත් කරුණු:**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.07.26 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිලධාරි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල, 02 වන මහල, අංක 130, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.**

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**